## ඔබගේ විවාහ දිවිය ශක්තිමත් කිරීම

### විවාහ වීමට පෙර: පූර්ව විවාහ පාඨමාලා

ස්ථිරසාර සබඳතාවයක් මගින් ඔබහට ඉදිරි ජීවිතයේදී මුහුණ දීමට සිදුවිය හැකි ගැටළු හා අභියෝග ජය ගැනීමට පන්නරය ලබා දෙයි. අදහස් හුවමාරු කරගැනීමේ පිළිවෙත් හා මනා සබඳතා ගොඩනගා ගැනීමේ නිපුණත්වය මුල් අවදියේ සිටම වර්ධනය කරගත්තේනම් අසීරු අවස්ථාවකට පත් වුවහොත් මෙමගින් යම් සහනයක් සලසා ගත හැක.

දිවි ඇති තෙක් නොබිඳී පවතින සබඳතා ගොඩනගා ගැනීමට ඉවහල් වන කුසලතා පුරුදු කරමින් හා විස්තර ලබාදෙමින් විවහපෙක්ෂිතයන් දැනුවත් කිරීම මෙම පූර්ව විවාහ පාඨමලාවාලින් සිදුකෙරේ. විවාහ වීමට බලාපොරොත්තු වන දෙදෙනෙකුට, ඊට පෙර විවාහයකින් ලත් දරුවන්ද සම්බන්ද කිරීමේදී අමතරව පැන නැගිය හැකි ගැටළු හා සංකීර්ණ තත්වයන් ගැඹුරින් විමසා බැලීමට සකසූ වෙනත් පාඨමාලාවක්ද ඉදිරිපත් කෙරේ.

### විවාහය අතරතුර: පවුල් උපදේශනය

විවාහ දිවිය නිසි ආකාරයෙන් හා අර්බුද වලින් තොරව පවත්වාගෙනයාම සැමවිටම පහසු කරුණක් නොවේ. ජීවිතයේ එක් එක් කාල පරිච්ඡේද වලදී තම සහකරු හෝ සහකාරිය සමග ගැටළු පැන නැගීමට ඉඩකඩ ඇත. අසීරු හා විශ්වාසය පළුදු වන අවදියකට පැමිණි විගසම සබඳතාව මුළුමනින්ම අනතුරේ වැටී ඇතැයි සිතිය නොහැක. එබඳු බාධාවකින් පැහැදිලි වන්නේ ඔබහට යම් පිළිසරණක් ලබා ගැනීම උචිත බවය.

විවාහ දිවිය ගත කරනා අතරතුර පවුලේ සාමාජිකයන් හා දරුවන් අතර ඉස්මතු විය හැකි වෙනස්කම් වලට හුරු වීමට හා ඒ පිළිගැනීමට විවාහක යුවලකට මග පෙන්වීමද පවුල් උපදේශන සේවාවෙන් සිදු කෙරේ. ඔබගේ විවාහක සහකරු හෝ හවුල්කරු සමග පැන නගින උද්වේගකර ගැටළු නිරාකරණයට හෝ මාපිය වගකීම් සම්බන්ධව එකඟතාවයකට පැමිණීමට පවුල් සේවා උපදේශකවරුන්ට සහය විය හැක.

### විවාහ සබඳතා බිඳ වැටීම: පවුල් ගැටළු නිරාකරණ සේවාව

විවාහ සබඳතා බිඳ වැටීමකදී ආරවුල් සමථයකට පත් කිරීම පවුල් ගැටළු නිරාකරණ සේවාවෙන් (Family Dispute Resolution - FDR) සිදු කෙරේ. එකිනෙකාගෙන් වෙන්ව විසීමට බලාපොරොත්තු වන යුවලකට දේපල, මුදල් වත්කම් මෙන්ම ඒ සියල්ලටම වඩා වැදගත් වන දරුවන් අරභයා යම් එකඟතාවයකට එළඹීමට මග පෙන්වයි. මාපියන් අතර ආරවුලක් නොවිසදා තිබියදී වෙන්ව යාමට තැත් කරනා අය හට නීතියෙන් පනවා ඇත්තේද මෙම ගැටළු පවුල් සමථ මණ්ඩලයකින් විසදා ගැනීමට අවංක උත්සාහයක් දරනා ලෙසය.

ඔබහට ගැටළු ගැන සාකච්ඡා කිරීමට, විකල්ප විසඳුම් ගැන සිතීමට හා අවසානයේ එකඟතාවයකට එළැඹීමට ඒ සඳහා නිසි අනුමැතිය ලත් පවුල් ගැටළු නිරාකරණ වෘත්තිකයෙකුට පුළුවන. මෙම පියවර අතිශයින් වැදගත් වනුයේ, දරුවන් ඇති නම් ඒ අය අරභයා ඉදිරි වැඩ කටයුතු සැලසුම් කර ගැනීමට මාපිය යුතුකම් හා වගකීම් මාලාවක් සකසා ගැනීමට පවුල් උපදේශක සේවාවෙන් උපදෙස් ලබා ගත හැකි බැවිනි.

**විවාපත් හෝ විවාහ අපේක්ෂිත යුවල් හා පවුල් වලට මෙම සේවාව සහ උපදෙස් සම්බන්ධව වැඩිදුර විස්තර දැන ගැනීමට Family Relationships Online හි www.familyrelationships.gov.au යන වෙබ් අඩවියට පිවිසීමෙන් හෝ පවුල් සබඳතා උපදේශන අංකය 1800 050 321 ඇමතීමෙන් අවස්ථාව ලැබේ.**

This information is provided pursuant to subsection 42(5A) of the *Marriage Act 1961* and regulation 39A of the *Marriage Regulations 1963*

# Happily Ever… Before and After

## විවාහ අපේක්ෂිත යුවල් හට තොරතුරු



## විවාහයේ වැදගත්කම

ඔබගේ විවාහ මෙහෙය පවත්වන පූජක තුමා මෙම ලියවිල්ල ඔබ අතට පත් කරනුයේ එක් වීමට තීරණය කිරීම විවාහ අපේක්ෂිත යුවළකට ගත හැකි අතිශයින් වැදගත් කටයුත්තක් බැවිනි. විවාහය, සැලකිය යුතු පරිවර්තනයක මුල් පියවර වනුයේ ඉන් ඔබ හට, ඔබගේ සහකරුට හා පවුලට වෙනස්කම් කිහිපයකට මුහුණ දීමට සිදුවන බැවිනි. මෙම ලියවිල්ලෙන් විස්තර වනුයේ :

- ඔස්ට්‍රේලියාවේදී  විවාහ වීමේදී අනුගමනය කල යුතු වැඩ පිළිවෙල
- විවාහ වීමෙන් පසුව බලපාන වැදගත් නීතිමය අංග කිහිපයක් සහ
- විවාහ සබඳතාව සාර්ථකව ඉදිරියට පවත්වාගෙන යාමට අනුබල දෙන අංග; එනම් යුග දිවිය ගැන මනා අවබෝධයක් ලබා ගැනීම, පවුල් උපදේශන සේවා හෝ අර්බුදකාරී අවස්ථා වලදී ගැටළු නිරාකරණය වල සහය පැතිය යුතු අවස්ථා

# ඔස්ට්‍රේලියාවේදී විවාහ වීම

ඔස්ට්‍රේලියාවේදී විවාහය සම්බන්ධව බලපානුයේ 1961 විවාහ ආඥා පනත වන අතර මෙහි සැකෙවින් දැක්වෙනුයේ විවාහ බන්ධනයකට ඇතුලත් වීමේ වැඩ පිළිවෙල හා වලංගු විවාහයක් සඳහා සපුරාලිය යුතු නීතිමය නියමයන්ය.

නිසි ලෙස සම්පූර්ණ කරන ලද "විවාහ අභිෂේකය පිලිබඳ දැනුම් දීමේ" ආකෘති පත ඔබ විවාහ දේව මෙහෙය පවත්වන පූජක තුමාට අවම වශයෙන් එක මසකට කලින් ලබා දිය යුතු වේ. මෙහි උපරිම සීමාව මාස 18 දක්වා දිව යයි.

ඔබ හා ඔබේ සහකරු විසින් නිසි පරිදි සනාථ වන සාක්ෂි ඇතිව ඔබ උපන් දිනය හා ස්ථානය, හඳුනාගැනීමේ ලියවිලි හා මීට පෙර සිදු වී ඇති විවාහ ඇතිනම් ඒ පවතින නීතියට යටත්ව අවසන් කල බවට දැනුම් දිය යුතුය.

ඔබ දෙදෙනා විසින් "විවාහයට බාධාවක් නොමැති බව සනාථ කිරීමේ" ලියවිල්ලක අත්සන් තැබිය යුතුය. මෙම ලියවිල්ලට අත්සන් තැබීමෙන් ඔබ පිලිගනුයේ විවාහ වීමට අවසර ලැබෙන වයස් මට්ටමට ඔබ ළඟා වී ඇති බවත්, එමෙන්ම යෝජිත විවාහය සඳහා කිසිදු නීතිමය බාධාවක් පැන නොනගිනා බවත්ය.

ඔබගේ මංගල දිනයේදී දේව මෙහෙය පවත්වන්නා විසින් විවාහ කිරීමේ කටයුත්ත උත්සවාකාරව ඉටු කරනු ඇත. ඉන් අනතුරුව ඔබට, ඔබ සහකරුට හෝ සහකාරියට මෙන්ම විවාහයේ සාක්ෂිකරුවන්ට විවාහ සහතික තුනක අත්සන් කිරීමට දේව මෙහෙය පවත්වන්නා සලසනු ඇත.

ඔබගේ විවාහයේ නීතිමය හා සිරිත් අනුකූල පියවර අවසන් වූ පසු දේව මෙහෙය පවත්වන්නා විසින්, විවාහය සිදුවූ පළාත අනුව "උපත්, මරණ හා විවාහ" කාර්යාලයේ ලියා පදිංචි කරනු ඇත.

# ඔස්ට්‍රේලියාවේ යුග දිවිය:
# ඔබ විසින් දැන ගත යුතු වැදගත් කරුණු කිහිපයක්

## සෞඛ්‍ය හා සමාජ සුභ සාධන දීමනා

ඔබ සෞඛ්‍ය හෝ සමාජ සුභ සාධන දීමනා ලබන්නෙකු නම්, ඔබ කල යුත්තේ එයට අදාල ආයතන අමතා ඔබ විවාහ වූ බව දැනුම් දීමයි. ඔබට ලැබෙන දීමනා අරභයා යම් වෙනසක් සිදු වේ නම්, ඒ බව මෙම ආයතන විසින් ඔබහට දන්වනු ඇත. විවාහයෙන් පසුව සාධාරණ කාල සීමාවන් ඇතුලත මෙම ආයතන වලට ඔබ විවාහ වූ බව දැන්වීමට අපොහොසත් වුවහොත් ඔබගේ දීමනා හා ආධාර අහිමි කිරීමට හෝ සමහරවිට දඩයකට ඔබ යටත් කිරීමට වුවද හැකියාව ඇත.

## ඔබගේ පෙළපත් නාමය වෙනස් කිරීම

විවාහ වන ඕනෑම පුද්ගලයෙකුටම තමන් කැමති නම් ස්වකීය සහකරුගේ පෙළපත් නාමය භාවිතා කල හැක.
විවාහ වීමෙන් පසු එසේ සිදු කල යුතුය කියා කිසිදු නීතිමය බලපෑමක් නොමැත.

ඔබ සහකරුගේ පෙළපත් නාමය භාවිතා කිරීමට බලාපොරොත්තු වන්නේ නම්, ඔබ පළාතේ "උපත්, මරණ හා විවාහ" ලියා පදිංචි කාර්යාලයෙන් නිකුත් කෙරෙන විවාහ සහතිකයක් ඔබ ලබා ගත යුතුය. ඔබගේ පුද්ගලික ලියවිලි (උදා: රියදුරු බලපත) විවාහ වූ තැනැත්තාගේ පෙළපත් නාමයට හරවා ගැනීමට මෙම සහතිකය සෑහේ.

ඔබ විවාහ වූ දිනයේදී ඔබ ලද සහතිකය මංගල උත්සවය වෙනුවෙන් නිකුත් කල සංකේතයක් පමණක් වන අතර ආගමන විගමන කාර්යාලය වැනි රජයේ ආයතන රැසක හඳුනාගැනීම තහවුරු කිරීමේ ලියකියවිල්ලක් ලෙස පිළිගනු නොලැබේ.

## පුරවැසිභාවය

ඔස්ට්‍රේලියානු පුරවැසියෙකු හා විවාහ වූ පමණින් ඔබට ඔස්ට්‍රේලියානු පුරවැසි භාවය හිමිවන්නේ නැත. ඔබ පුරවැසි භාවය සඳහා ඉල්ලුම් කල යුතු අතර ඒ සඳහා ඇති සුදුසුකම් සපුරාලිය යුතුය. මේ පිලිබඳ වැඩිපුර විස්තර ඔබට Department of Immigration and Border Protection හි www.immi.gov.au යන වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

## අවසන් කැමති පත සකස් කිරීම

ඔබ මේ විවාහය සිදු කිරීමට සැලසුම් කරන බව ඔබගේ අවසන් කැමති පතෙහි පැහැදිලිව සටහන් කොට නොතිබුණි නම්, විවාහයට පෙර සකස්කළ අවසන් කැමති පත් විවාහයත් සමඟ අහෝසි වී යනු ඇත.

ඔබගේ පුද්ගලික පසුබිමෙහි වෙනසක් සිදු වූ මෙම අවස්ථාවේදී නව අවසන් කැමති පතක් සකස් කිරීම වැදගත්ය. වලංගු අවසන් කැමති පතක් තිබීම මගින්, ඔබ මරණයට පත් වූ පසු ඔබගේ දේපල ඔබගේ අභිමතය පරිදි බෙදා හැරෙන බවට තහවුරු වේ. අවසන් කැමති පතක් සකස් කිරීමට හෝ වෙනස් කිරීමට ඔබට වරලත් නීතිවේදියෙකුගේ සහය ලබා ගත හැක.

## විවාහයෙන් පසුව බදු ගෙවීම

ඔබ විවාහ වූ පසු ඔබ ගෙවිය යුතු බදු මුදල් වල වෙනසක් සිදුවිය හැක. විවාහයට පෙර Australian Taxation Office (ATO), බදු නියෝජිතයෙකු හෝ ගණකාධිකාරිවරයෙකු අමතා ඒ පිලිබඳ උපදෙස් ලබා ගන්නේ නම් මැනවි.